# FPA පුවත් සංග්‍රහය

2015 පළමු කලාපය

www.fpasrilanka.org

**තිරසාර සංවර්ධන ඉලක්ක ජයගනිමු...**

## අපේ කාන්තාවන්ට ප්‍රජනක සෞඛ්‍ය සේවා සහ නිසි දැනුම තව තවත් ලබා දෙමු.

*- අනෝමා ගමගේ*

**කෘෂිකර්ම නියෝජ්‍ය අමාත්‍ය**




ගරු කෘෂිකර්ම නියෝජ්‍ය අමාත්‍ය අනෝමා ගමගේ මහත්මිය සභාව අමතමින්...
වමේ සිට : ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ ජාතික කමිටු සාමාජිකා වෛද්‍ය එස්තර් අමරසේකර මහත්මිය, ගරු සභාපතිනි විශේෂඥ වෛද්‍ය ප්‍රාමිලා සේනානායක මහත්මිය, අම්පාර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෛද්‍ය ඩී. සී. ඇස්. තලගල මහතා, අම්පාර මහා රෝහලේ අධ්‍යක්ෂ වෛද්‍ය ලංකාතිලක ජයසිංහ මහතා.

ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමය මඟින් ලබා දෙන ප්‍රජනක සෞඛ්‍ය සේවා සහ ඒ පිළිබඳ නිවැරදි දැනුම තව තවත් අපේ කාන්තාවන්ට ලබා දීම ඉතා අවශ්‍ය වන්නක් බව ගරු කෘෂිකර්ම නියෝජ්‍ය අමාත්‍ය අනෝමා ගමගේ මැතිතුමිය ප්‍රකාශ කළාය.

එතුමිය මේ පිළිබඳ ප්‍රකාශ කළේ අම්පාර දිස්ත්‍රික්කයේ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවල ප්‍රධානීන් සඳහා ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ අම්පාර සුවසේවා මධ්‍යස්ථානය මඟින් ක්‍රියාත්මක වන වැඩපිළිවෙළ පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් අම්පාර සුවසේවා මධ්‍යස්ථානයේ පසුගියදා පැවති අවස්ථාවේදී ය.

## මාතරට FPA සුවසේවා මධ්‍යස්ථානයක්...



රුහුණු විශ්වවිද්‍යාලයේ උප කුලපති මහාචාර්ය ගාමිණී සේනානායක මහතා පීත්ත පටිය කපමින්... විධායක අධ්‍යක්ෂිකා තුෂාරා රණසිංහ මහත්මිය, හිටපු ගරු ලේකම්වරයකු වන ලාල් හේවාපතිරණ මහතා, (වමේ සිට දෙවැන්නා), නියෝජ්‍ය විධායක අධ්‍යක්ෂ ලසන්ත ගුණරත්න මහතා විවෘත කිරීමට සහභාගී වෙමින්...

ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ හත්වන FPA සුවසේවා මධ්‍යස්ථානය පසුගියදා මාතර දී විවෘත කරන ලදි. දකුණු පළාත තුළ සේවා කටයුතු පුළුල්ව ලබා දීමට එයින් හැකියාව ලැබේ. වයිට් හවුස්, එළියකන්ද, මාතර යන ස්ථානයේ සුවසේවා මධ්‍යස්ථානය පිහිටා ඇත.

## ජනගහනය සහ සංවර්ධනය පිළිබඳ කොමිසමේ 48 වැනි (48th CPD) සැසියට සහභාගීවෙමින්...




*විස්තර 04 වැනි පිටුවට...*

## ගබ්සාව හා සම්බන්ධ ගැටලු පිළිබඳ ජාත්‍යන්තර සමුළුව

ගබ්සාව හා සම්බන්ධව පැන නැගී ඇති ගැටලු සහ ඒ සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ ජාත්‍යන්තර සමුළුවක් පසුගියදා කොළඹ සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේදී පැවැත්විය. ලෝක සෞඛ්‍ය සංවිධානයේ ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය පිළිබඳ දෙපාර්තමේන්තුවේ මූල්‍ය අනුග්‍රහය යටතේ, ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමය විසින් මෙය සංවිධානය කරනු ලැබීය.




ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ ගරු සභාපති වෛද්‍ය ප්‍රාමිලා සේනානායක, මහාචාර්ය අතුල කළුආරච්චි, මහාචාර්ය හර්ෂ සෙනෙවිරත්න, පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ අධ්‍යක්ෂ වෛද්‍ය හේමන්ත බෙනරගම, ලෝක සෞඛ්‍ය සංවිධානය වෛද්‍ය බෙලා ගැනට්‍රා, වෛද්‍ය පිලිප් ගෙස්ට්, වෛද්‍ය සුගන්ධිකා පෙරේරා, වෛද්‍ය මංගල දිසානායක, වෛද්‍ය සජීව ගොඩකන්ද, වෛද්‍ය අර්වින්ඩ් මතූර්, වෛද්‍ය කනිෂ්ක කරුණාරත්න, ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ විධායක අධ්‍යක්ෂිකා තුෂාරා රණසිංහ, වෛද්‍ය ඒකකයේ අධික්ෂිකා වෛද්‍ය සුමිත්‍රා තිසේරා යන මහත්ම මහත්මීන් ඇතුළු පිරිසක් සහභාගි වූහ.

## ‘දිරිය ප්‍රසාදිනී’ සම්මාන ලබමින්...



ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ විධායක අධ්‍යක්ෂිකා තුෂාරා රණසිංහ ආගුස් මහත්මිය වෙත ලෝක කාන්තා දිනය නිමිත්තෙන් ‘දිරිය ප්‍රසාදිනී’ සම්මානය, ගාල්ල සවිය සංවර්ධන පදනම මගින් පිරිනමූ අවස්ථාව...

ප්‍රජනක සෞඛ්‍ය හා ප්‍රජා සේවාවන් මගින් කාන්තාවන් සවිබල ගැන්වීම සහ සමාජ අභිවෘද්ධිය උදෙසා කරනු ලබන දායකත්වය වෙනුවෙන් මෙම සම්මානය විධායක අධ්‍යක්ෂ තුමිය වෙත පිරිනමනු ලැබීය.

## පාර්ලිමේන්තු මන්ත්‍රීන් මඟින් ජනතාව සෞඛ්‍ය සම්පන්න කිරීමේ වැඩසටහන

මෙම ව්‍යාපෘතිය යටතේ වැඩසටහන් මාලා දෙකක් ගම්පහ දිස්ත්‍රික්කයේ සහ අනුරාධපුර දිස්ත්‍රිකයේ පවත්වනු ලැබීය. ලෝක කාන්තා දින ජාතික වැඩසටහනට සමගාමීව කාන්තා කටයුතු පිළිබඳ ගරු අමාත්‍ය චන්ද්‍රානි බණ්ඩාර මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවැති දැනුවත් කිරීමේ වැඩසටහන සහ වෛද්‍ය සායනය (පහළ වම් ඡායාරූප) අනුරාධපුර සල්ගාදු ක්‍රීඩාංගණයේදී ද උසස් අධ්‍යාපන සහ පර්යේෂණ ගරු නියෝජ්‍ය අමාත්‍ය සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් සීදුව නගර සභාවේදී සහ මීගමුව තිඹිරිගස්කටුවේදී ද දැනුවත් කිරීමේ වැඩසටහන් සහ ජංගම වෛද්‍ය සායන පවත්වන ලදි. EC Champions Project යටතේ මෙය සිදු කරන ලදි.







## ලෝක කාන්තා දිනය 2015

# කාන්තාව සවිබල ගන්වමු මනුෂ්‍යත්වය සවිබල ගන්වමු

**ලෝක කාන්තා දිනය නිමිත්තෙන් ක්‍රියාකාරී කාන්තා නායිකාවන් කිහිපදෙනෙකු අපගේ ඉල්ලීම පරිදි ලබා දුන් විශේෂ පණිවිඩ කිහිපයකි මේ...**



**චන්ද්‍රානි බණ්ඩාර**
**ගරු කාන්තා කටයුතු පිළිබඳ අමාත්‍ය**

ලෝක කාන්තා දිනය සමරන මොහොතේ අපේ රටේ කාන්තාවන් පිළිබඳ අවධානය යොමුකිරීම ඉතා වැදගත්.

දියණියක්, බිරිඳක්, මවක් ලෙස කාලයෙන් කාලයට කාන්තාවගේ භූමිකාව බොහෝවිට වෙනස් වෙනවා. නමුත් මේ කවර ආකාරයකට කාන්තාවක් ලෙස බැලුවත් ලොකු වගකීමක් වගේම ලොකු දරාගැනීමක් සිදුකරන්නට කාන්තාවන්ට සිදුව තිබෙනවා.

හැබැයි මෙම තත්ත්වය මේ ආකාරයටම තිබිය යුතුද යන්න අප අවධානය යොමුකළ යුතු කරුණක්.

වැඩියෙන්ම දුක දරාගන්න, වැඩියෙන්ම අපහාස විඳගන්න, වැඩියෙන්ම දූෂණයට අපයෝජනයට ලක්වන තත්ත්වයකට කාන්තාව පත්විය යුතු නැහැ.

අපි වෙනස් කළ යුතු කාලය දැන් එළඹ තිබෙනවා යැයි මම හිතනවා. කාන්තාවන්ගේ දැනුවත්භාවය හැම තරාතිරමකම වැඩි විය යුතුයි.

එවගේම පවුල් මට්ටමේ සිට ඉහළ ප්‍රතිපත්තිමය තීරණ ගැනීම දක්වා කාන්තා නියෝජනය අත්‍යවශ්‍යයයි.

මෙවර ලෝක කාන්තා දිනයේ තේමාව කාන්තාව සවිබල ගන්වමු මනුෂ්‍යත්වය සවිබල ගන්වමු යන්නයි. ඒ වගේම ලංකාවේ අපි 'කාන්තාවන්ට යහපත් රටක්' යන තේමාව වැඩි අවධානයකට යොමු කර තිබෙනවා.

ලෝකයට බිහිවන සෑම දරුවකුටම මුල්ම ආදරය - සෙනෙහස ලැබෙන්නේ අම්මාගෙනි. ඒ වගේම පුංචි දරුවෝ වැඩිම සමීප සම්බන්ධයක් පවත්වන්නේ අම්මා සමඟය. ලොව පුරා මනුෂ්‍යත්වය අමතක කරන කාලයක අම්මාගෙන් නැතිනම් කාන්තාවගේ කාර්ය භාරය සුවිශේෂ වන්නේ ඒ නිසයි.

සෑම කාන්තාවකගේම සෞඛ්‍ය සම්පන්න භාවය, සෑම කාන්තාවකගේම දැනුවත් භාවය, හොඳ අධ්‍යාපනයක් ලබා දීම. සෑම කාන්තාවකටම ශක්තිමත් ආර්ථික තත්ත්වයක් ලබා දීම. සෑම කාන්තාවකටම ජීවත් වීමට නිදහස් ආරක්ෂිත පරිසරයක් තැනීම, කාන්තාවන්ට යහපත් රටක් වෙනුවෙන් අප යන ගමනේ අරමුණ වෙනවා.



**සුමේධා ජී. ජයසේන**
**ගරු පාර්ලිමේන්තු මන්ත්‍රිනි**
**පාර්ලිමේන්තු කාන්තා සංසදයේ ගරු සභාපතිනි**

පාර්ලිමේන්තු කාන්තා සංසදය මඟින් විවිධ වැඩසටහන් කාන්තාවන් වෙනුවෙන් පසුගිය කාලවකවානුවේ අප විසින් ක්‍රියාත්මක කර තිබෙනවා. දැනටත් ඒවා ක්‍රියාත්මක කරමින් පවතිනවා. විවිධ රටවලට පාර්ලිමේන්තු කාන්තා සංසදවල කටයුතු අප නිරීක්ෂණය කළා. එහිදී අපට දැකගන්නට ලැබුනු දෙයක් තමයි පළාත් පාලන ආයතනවල, පළාත්සභා, පාර්ලිමේන්තුව ආදී තැන්වල ඉතාම අඩු සංඛ්‍යාවක් කාන්තා නියෝජනයක් ඇත්තේ ශ්‍රී ලංකාවේ බව. ලෝකයෙන් දියුණු රටවල වගේම පකිස්ථානය, බංගලාදේශය වැනි මුස්ලිම් රටවල පවා 30% ක පමණ පාර්ලිමේන්තු කාන්තා නියෝජනයක් තිබෙනවා. අපේ උත්සහය 25% දක්වාවත් කාන්තා නියෝජනයක් ලබාගැනීමටයි.

එසේම ගෘහමූලික කාන්තා පවුල්වල ඉතා දිළිඳු තත්ත්වයක පිරිසක් ඉන්නවා. ඔවුන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම අපේ තවත් පරමාර්ථයක්. මේ කාන්තාවන් සවිබල ගැන්වුවහොත් රටේ බොහෝ ප්‍රශ්න විසඳා ගැනීමට හැකියි. දරුවන්ගේ රැකවරණය ආරක්ෂාව. මෙය අත්‍යවශ්‍ය කාර්යයක් ඒ අයට යම්කිසි අතදීමක්, සවිබලගැන්වීමක් පසුගිය කාලයෙත් කරගෙන ගියා, දැනටත් ඉදිරියටත් කරගෙන යනවා. කාන්තාවෝ විවිධාකාර නොයෙකුත් හිංසනයන්ට ලක්වෙනවා. මේවා නවත්වන්න අවම කරන්න අප උත්සාහයක් ගත්තා. ඒත් හරිහැටි එය කිරීමට නොහැකිව තිබෙනවා. කාන්තා සංසදය තුළින් අප බලාපොරොත්තු වෙනවා මේ සඳහා අලුත් නීති සම්පාදනය කිරීමට. නීති තිබුණත් ඒවා ක්‍රියාත්මක වීමේදී අඩුපාඩු තිබෙනවා.

මම කාන්තා අමාත්‍යාංශයේ ඇමති වශයෙන් සිටින විට 1929 දුරකථන අංකය හදිසි පැමිණිලි සඳහා ඇතිකළා. කාන්තා ප්‍රශ්න කථාකිරීමට කමිටුවක් පත්කර තිබෙනවා. අපි රටේ කාන්තාවන්ට ආරාධනය කරනවා ඔබට විසඳාගැනීමට අපහසු ප්‍රශ්නයක් ඔබට තිබෙනවා නම් ඒවා අපගේ කාන්තා සංසදයේ උපදේශන කාරක සභාවට ඉදිරිපත් කරන්න කියා.



**වෛද්‍ය සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ**
**ගරු උසස් අධ්‍යාපන පර්යේෂණ නියෝජ්‍ය අමාත්‍ය**

අද ශ්‍රී ලංකාවේ කාන්තාවන් ජයග්‍රහණ ලබාගෙන සිටිනවා. නිදහස් අධ්‍යාපනය, නිදහස් සෞඛ්‍ය නිසා සමාජ සංවර්ධනය, ආර්ථික සංවර්ධනයට වඩා ඉදිරියෙන් තිබෙනවා. මාතෘ මරණ දකුණු ආසියා කලාපයේ අඩුම රට ශ්‍රී ලංකාව; ළදරු මරණ අනුපාතිකය අඩුයි. සෞඛ්‍ය තුළ ගුණාත්මක වර්ධනයක් සිදුව තිබෙනවා. කාන්තාවන්ට අධ්‍යාපන අවස්ථා තිබුණත් ඉහළ තනතුරුවලට යෑමේදී සීමා පැනවී තිබෙනවා. කාන්තාව අම්මා කෙනෙක්; දරුවෝ රැකබලාගැනීම නිසා රටේ සමස්ත සංවර්ධන කාර්යයට ඇයගෙන් ලැබෙන දායකත්වය අඩුයි. රැකියාවල නිරතවන්නේ 30%ක් පමණ කාන්තාවන් පිරිසක්. දිවා සුරැකුම් මධ්‍යස්ථාන මඟින් ආරක්ෂිත රැකවරණය දරුවන්ට දිය හැකිනම් කාන්තාවන් බොහෝ දෙනෙකු ඉදිරියට ඇවිත් රට වෙනුවෙන් සේවය කිරීමට අවස්ථාව ලැබෙනවා. අද කාන්තාවනට සහ ළමුන්ට සිදුවන හිංසන නිසා ආත්මාභිමානයකින් උපරිම ආකාරයකින් තම ඵලදායිතාව රටට ලබාගැනීම ගැටලුවක් වී තිබෙනවා. කාන්තාවන්ට සහ ළමුන්ට සිදුවන හිංසන සම්පූර්ණයෙන්ම පිටුදකින්න කටයුතු කළ යුතුය.



**අනෝමා ෆොන්සේකා**
**සභාපති - රණවිරු සේවා අධිකාරිය**

මම හිතන්නේ 'කාන්තා දිනය' ගැන කතා කරන කොට හැම වසරකම එක දිනයකට පමණක් සීමා වෙලා කියාය. එක් පිරිසක් පමණයි මාර්තු 08 වැනිදාට කාන්තාවන් වෙනුවෙන් කතාකරලා ඒ සඳහා වෙහෙසෙන්නෙ. අපට සංස්කෘතියක් තියෙනවා. ඒ සංස්කෘතියත් එක්ක කාන්තාවගේ කටයුතු බැඳී තිබෙනවා. සමතැනට වඩා නිසි තැන ලැබෙනවානම් ගෞරවනීය ලෙස ඉතාමත් සතුටුදායක ප්‍රතිඵලයක් ලැබෙනවා. සමහරු තමන්ගේ අම්මාට, බිරිඳට, දියණියන්ට, සොහොයුරියට, කාන්තාවට ගෞරවනීය ලෙස සලකන්නවත් දන්නේ නෑ; හැබැයි කාන්තාවන් පවා දැනගතයුතුයි නිසි තැන ලබාගෙන තමන්ට ගෞරවය ලැබෙන සේ කටයුතු කිරීමට. පෙරදිග කාන්තාවට විශාල ගෞරවයක් තිබෙනවා. කාන්තාවත් නිසි තැන රැකගෙන සිටිය යුතුයි.



**තුෂාරා රණසිංහ**
**විධායක අධ්‍යක්ෂිකා**
**ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමය**

ජාත්‍යන්තර කාන්තා දිනය කාන්තාවන් ගෞරවයට පැසසුමට ලක්කරන දිනයක්. කාන්තාවට ඇති වගකීම විශාලයි. බොහෝ කාන්තාවන් ගෘහනියන්, අම්මලා; එවගේම අපේ බොහෝ දෙනෙක් වැඩකරනවා. මේ කටයුතු සියල්ල තුලනය කරගෙන ඉදිරියට යෑම කාන්තාවට ලොකු අභියෝගයක්.

කාන්තාව සවිබල ගැන්වීම කළ යුත්තේ ඉපදුනුදා පටන් ය. හොඳ සෞඛ්‍ය අඩිතාලමක් දැමිය යුතුයි; අධ්‍යාපනයට නැඹුරු කර දක්ෂතා මතුකර ගත යුතුයි. කාන්තාව රටක ප්‍රගතියට සම සමව දායකත්වය දරනවා. ඇය සෞඛ්‍යයෙන් ශක්තිමත් වනවා යනු, මුළු පවුලම සෞඛ්‍ය සම්පන්න බවයි. ඇය දැනුමෙන් පෝෂණය වනවා යනු ඒ පවුලේ අධ්‍යාපන තත්ත්වය ඉහළ බවයි. ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමය හැටියට කාන්තා ඔබ සියලු දෙනාගේ සෞඛ්‍ය නංවාලීමට අප ඇප කැපවී සිටිනවා.

*පළමු පිටුවෙන්...*

## ජනගහනය සහ සංවර්ධනය පිළිබඳ කොමිසමේ 48 වැනි (48th CPD) සැසියට සහභාගීවෙමින්...

නිව්යෝර්ක් නුවර එක්සත් ජාතීන්ගේ මූලස්ථානයේදී පසුගිය අප්‍රේල් මාසයේ පැවැති මෙම ජාත්‍යන්තර සැසියේදී ලොව පුරා ජනගහනයේ සිදුව ඇති නූතන පරිවර්තන සහ තිරසාර සංවර්ධනයේ දී බලපාන ජනගහ ගැටලු පිළිබඳ අවධානය යොමුකරන ලදි.

ශ්‍රී ලංකා දූත පිරිසේ නායකත්වය ළමා කටයුතු පිළිබඳ ගරු රාජ්‍ය අමාත්‍ය රෝසි සේනානායක මහත්මිය විසින් හොබවන ලද අතර ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ අධිවාචන සහ HIV ඒකකයේ අධ්‍යක්ෂිකා මධූෂා දිසානායක මහත්මිය, කාන්තා සහ මාධ්‍ය එකතුවේ කුමුදුනී සැමුවෙල් මිය, සබ්රිනා යූසුෆ්අලි මෙනවිය සහ ළමා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ සම්බන්ධීකරණ ලේකම් නිරූපා කරුණාරත්න මෙනෙවිය මේ සඳහා සහභාගී වූහ.

# 2014 සේවා සම්මාන ලාභීන්

ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ කාර්ය මණ්ඩලයේ දීර්ඝ කාලීන සේවා ඇගයීම සඳහා සම්මාන පිරිනැමීම පසුගිය ජනවාරි 01 වැනිදා සිදුවූ අවස්ථාව.

### වසර 30ක සේවා කාලය වෙනුවෙන්



අලෙවිකරණ ඒකකයේ වැඩසටහන් සම්බන්ධීකාරක එම්. පී. සේනාරත්න මහතා, ගරු සභාපතිනි වෛද්‍ය ප්‍රාමිලා සේනානායක මහත්මිය අතින් තිළිණ ලබමින්.

### වසර 25ක සේවා කාලය වෙනුවෙන්



ක්ෂේත්‍ර වැඩසටහන් ඒකකයේ කළමනාකාර අමරා රණසූරිය මහත්මිය, මහාචාර්ය හර්ෂ සෙනෙවිරත්න මහතා අතිනන් තිළිණ ලබමින්.

### වසර 10ක සේවා කාලය වෙනුවෙන්





නියෝජ්‍ය, විධායක අධ්‍යක්ෂ ලසන්ත ගුණරත්න මහතා ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ හිටපු ගරු ලේකම් ලාල් හේවාපතිරණ මහතා අතින් තිළිණ ලබමින්. (වමේ) මූල්‍ය ඒකකයේ ගංගා ෂාමලී මහත්මිය, ජාතික මණ්ඩලයේ හිටපු ගරු සාමාජිකා ශ්‍රියාකාන්ති ධර්මදාස මෙනෙවිය අතින් තිළිණ ලබමින්. (දකුණේ)

### වසර 15ක සේවා කාලය වෙනුවෙන්

අලෙවිකරණ ඒකකයේ සහකාර ප්‍රාදේශීය අලෙවි කළමනාකාර බී. ඒ. තුෂාර මහතා

# උපදේශන වැඩසටහන්



සහකාර අධ්‍යක්ෂිකා භද්‍රා උඩවත්ත මහත්මිය වැඩමුළුවක් මෙහෙයවමින්...

### ආතති කළමනාකරණය

එදිනෙදා ජීවිතයේ නොයෙකුත් පීඩාකාරී ගැටලුවලට ඔබට මුහුණදීමට සිදුවිය හැක. ඒවාට මුහුණ දෙමින්, තම ඉලක්ක කරා යොමුවීමටත්, නොසැලී සිටීමටත්, ඒ සඳහා අනුගමනය කළ යුතු විද්‍යාත්මක ක්‍රමවේදයන් මෙම වැඩසටහන් මඟින් පැහැදිලි කරයි.

### පෞරුෂ සංවර්ධන කුසලතා

කෙනෙකුගෙ පෞද්ගලික ගුණාංග හඳුනාගෙන එහි ඌනතා සංවර්ධනය කරගැනීම සඳහා මඟ පෙන්වීම මෙවැනි වැඩසටහන් මඟින් සිදුවේ.

### ලිංගික ප්‍රතිකර්ම

ප්‍රජනක පද්ධතිය පිළිබඳව විද්‍යාත්මකව අවබෝධයක් ලබාදී සාමාන්‍ය ලිංගික චර්යා සහ අසාමාන්‍යතා ලිංගික චර්යා පිළිබඳව අවබෝධයක් ලබාදීම මෙම වැඩසටහන් මඟින් සිදුකරයි. නිරෝගී පුද්ගලයෙකු ලෙස උපරිම මානසික තෘප්තියක් ලබාගෙන සාර්ථක ජීවිතයක් ගතකිරීමට මඟපෙන්වීම මෙම වැඩසටහන් මඟින් සිදුකරයි.

**ආලෝකය උපදේශන සේවා සඳහා අමතන්න**
**011-2 555 455**

## ස්වෙච්ඡා සේවිකාවන් 5 දෙනෙකු රාජ්‍ය සේවාවට...

කිලිනොච්චියේ සේවා මධ්‍යස්ථානයේ ස්වේච්ඡා සේවාවේ නිරතව සිටි ස්වේච්ඡා සේවිකාවන් 5 දෙනෙකුට සෞඛ්‍ය අමාත්‍යංශයේ රැකියා පත්වීම් ලැබී ඇත.

මෙම පත්වීම් හිමිවී ඇත්තේ එස්. කේ. කාජන්තිනි (මල්ලාවි), එස්. නිශාන්තිනි (මල්ලාවි), එස්. පවිතිරා (මුලතිව්), ඒ පුෂ්පලතා (ඔඩ්ඩුසුඩාන්), එස්. දීපිකා සමන්මලී (වැලිඔය), පී. බාමා (ඔඩ්ඩුසුඩාන්) යන ස්වේච්ඡා සෞඛ්‍ය සේවිකාවන් වෙතය.

ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ සේවා මධ්‍යස්ථානය හරහා ප්‍රජා සේවාවන් වෙත සුවිශේෂ දායකත්වයක් ලබාදුන් ඔවුන් වෙත අපි අපගේ සුබ පැතුම් එක්කරමු.

# FPA පුවත් සංග්‍රහය

2015 පළමු කලාපය

www.fpasrilanka.org

**තිරසාර සංවර්ධන ඉලක්ක ජයගනිමු...**

**ප්‍රජනක සෞඛ්‍ය පිළිබඳ තොරතුරු, වෛද්‍ය උපදෙස් හෝ උපදේශන සේවා ඔබ ඉන්නා තැන සිටම ලබාගැනීමට**
**අමතන්න 2 588 488**
**පිවිසෙන්න www.happylife.lk**
**SMS කරන්න 071 6 408 408**

37/27, බුලර්ස් පටුමග, කොළඹ 07. දුරකථන : 011 2 555 455
ෆැක්ස් : 011 2 55 66 11 ඊ මේල් : fpa@fpasrilanka.org

## HIV පිළිබඳ මාධ්‍ය දැනුවත් කිරීම...

ගෝලීය අරමුදලේ දකුණු ආසියානු කලාපීය HIV ව්‍යාපෘතිය යටතේ මාධ්‍යවේදීන් සඳහා පැවැති වැඩමුළුවේ අවස්ථා...




ඉහළ ඡායාරූපයේ වමේ සිට HIV සහ අධිවාචන ඒකයේ අධ්‍යක්ෂිකා මධූෂා දිසානායක මහත්මිය, විශේෂඥ මනෝ වෛද්‍ය කපිල රණසිංහ මහතා, UNAIDS ආයතනයේ ශ්‍රී ලංකා සම්බන්ධීකාරක වෛද්‍ය දයනාත් රණතුංග මහතා, අධිකරණ අමාත්‍යංශයේ අතිරේක ලේකම් ලක්ෂ්මි ගුණසේකර මහත්මිය මාධ්‍ය වැඩමුළුව සඳහා සහභාගි වෙමින්...

## ස්ත්‍රී - පුරුෂ සමාජභාවය මත ඇතිවන හිංසනය තේමාකරගත් කෙටි චිත්‍රපටියක්



වෛද්‍යවරියක හෝ වෛද්‍යවරයෙකු හමුවීමට එක්වරක් පැමිණි කාන්තාවක් තමුන්ට 'ලෙඩක්' ඇති බව ප්‍රකාශකරයි. එම ලෙඩට බෙහෙත් කළ පසු නැවතත් පැමිණ තවත් 'ලෙඩක්' ගැන කියයි. ඇයට, කියන ආකාරයේ 'ලෙඩක්' ඇත්දැයි වෛද්‍යවරයාට ගැටලුවක් පැන නගී. මෙවැනි සිද්ධීන් බොහෝමයක් තිබිය හැක. මෙවැනි කාන්තාවන් බොහෝ දෙනෙකුට සැබැවින්ම තමන් මුහුණ දෙන හිංසාකාරී තත්ත්වය එක එල්ලේ ප්‍රකාශකරගත නොහැකිය. ඔවුන් 'බෙහෙත්' ටිකක් අරගෙන හිත හදාගන්නවාද? මෙවැනි බොහෝ දේ පිළිබඳ අවධානය යොමුකිරීම ඉලක්ක කරගනිමින් මෙම කෙටි චිත්‍රපටය නිර්මාණය කිරීම සිදුකරයි.

වෛද්‍ය ඒකකයේ අධ්‍යක්ෂිකා වෛද්‍ය සුමිත්‍රා තිසේරා මහත්මියගේ අධීක්ෂණය යටතේ මෙය සිදුවේ.




## ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය සහ HIV අතර පවත්නා සම්බන්ධතාව - EU ව්‍යාපෘතිය

ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය සහ HIV අතර පවත්නා සම්බන්ධතාවය පිළිබඳ EU ව්‍යාපෘතිය යටතේ මඩකලපුව දිස්ත්‍රික්කයේ තරුණ පිරිසක් වෙත දැනුවත් කිරීම සඳහා පැවැති වැඩමුළුවක් මඩකලපුව FPA සුවසේවා මධ්‍යස්ථානයේ සම්බන්ධීකරණයෙන් පැවැත්විය.

VISION2020
Sexual and reproductive health rights for all

සංස්කරණය : ආනන්ද බෝධිනායක - ananda@fpasrilaka.org
සම්බන්ධීකරණය : අධිවාචන (Advocacy) ඒකකය